

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

2024

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

அரச தொழில்முயற்சிகள் திணைக்களம்
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

Department of Public Enterprises
Ministry of Finance, Planning & Economic Development

මහා භාණ්ඩාගාරය
කොළඹ 01

பொது திறைசேரி
கொழும்பு 01

General Treasury
Colombo 01

කාර්යසාධන වාර්තාව - 2024

වැය ශීර්ෂය - 241

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය **1- 4**

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 1

1.3 ප්‍රධාන කාර්යයන් 2

1.4 සංවිධාන සටහන 3

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 4

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 4

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) 4

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 5- 6

පරිච්ඡේදය 03 – 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය **7- 12**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 7

3.2 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය 8

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 9

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 10

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 11

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 11

3.7 මු.රෙ.208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන 11

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 12

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව **13 - 23**

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක **24 - 28**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 24 - 28

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය **29 - 31**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 29 - 30

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 31

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ **32**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 32

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය 32

6.3 මානව සම්පත් සංවර්ධනය 33 - 39

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව **40 - 49**

1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

රජය සතු ව්‍යාපාරයන්හි [1] යහපාලන පැවැත්ම තහවුරු කිරීම තුළින් එම ආයතනවල කාර්යසාධනය ඉහළ නැංවීමේ අරමුණින් රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය අධීක්ෂණය සිදු කරන මූලික රාජ්‍ය ආයතනය ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2002 වර්ෂයේදී නැවත ප්‍රතිස්ථාපනය කරන ලද අතර 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ විධිවිධාන අනුව රාජ්‍ය සංස්ථාවල මූල්‍ය පාලනය ස්ථාපනය කිරීමේ කටයුතු ද දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට ගැනේ.

රජය සතු ව්‍යාපාර බලශක්තිය, ජලය, බැංකු හා රක්ෂණ, වරාය, පොදු ප්‍රවාහන, ගුවන් සේවා, ඉදිකිරීම් සහ ක්‍රමෝපායික අංශයන්හි සීමිත ව්‍යාප්තියක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සුවිශේෂී අංගයක්ව පවතී. රජය සතු ව්‍යවසායන් 462 ක් අතරින් ව්‍යාපාර 52 ක් ජාතික ආර්ථිකය ඉහළ වර්ධන තලයකට පරිවර්තනය කිරීමෙහිලා උත්ප්‍රේරණ කාර්යයක් සිදු කරන අතර, මේවා ක්‍රමෝපායිකව වැදගත්වන රජය සතු වාණිජ ව්‍යවසායන් [2] ලෙස හඳුනාගෙන ඇත. වර්තමානයේ රජය සතු ව්‍යවසායන් වලින් 335 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඉතිරි රාජ්‍ය ව්‍යවසායන් 127 ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කෙරේ.

1.2. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම

මෙහෙවර

රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම සඳහා, විශිෂ්ට පරිචයන් භාවිතා කරමින් යහපත් අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ශක්තිමත් කිරීම

අරමුණු

- රාජ්‍ය ව්‍යවසායයන් තුළ යහපාලනය වැඩි දියුණු කිරීම
- මහජන යහපත සුරක්ෂිත කිරීම
- හොඳම භාවිතයන් තුළින් කාර්යසාධනය ප්‍රශස්ත කිරීම


1.ඕනෑම ලිඛිත නීතියකින් ස්ථාපිත කොට ඇත්තා වූ රජයට අයිතිය හිමිවන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ වෙනත් ඕනෑම ආයතනයක් සහ රජයට බහුතර අයිතිය හිමි වන්නා වූ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති වාණිජ හෝ වාණිජ නොවන ක්‍රියාකාරකම් සිදු කරන්නා වූ සමාගම් රජය සතු ව්‍යාපාර වේ.

2.සේවා සහ භාණ්ඩ විකිණීම මඟින් ආදායම් උපයනු ලබන ව්‍යාපාර කටයුතු වල නියැලී සිටින රජය සතු ව්‍යාපාර රජය සතු වාණිජ ව්‍යාපාර වේ.

1.3. ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීම.
- වාණිජ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.
- රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ක්‍රියාත්මක කිරීමට අදාළව නව චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශවල සඳහන් යෝජනා අධ්‍යයනය කිරීම හා විශ්ලේෂණය කිරීම.
- රජය සතු ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය.
- පුද්ගලීකරණය කරන ලද රජය සතු ව්‍යාපාරවලට අදාළව අවබෝධතා ගිවිසුම්වල ඇතුළත් කරුණු පසු විපරම් කිරීම හා එම ආයතන හා සම්බන්ධ ගැටළු විසඳීමට සහාය වීම.
- පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කමිටුව සඳහා සහභාගී වීම සහ සහාය දැක්වීම.

1.4. සංවිධාන සටහන



අ.අ.ජ. -අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අ. - සහකාර අධ්‍යක්ෂ

ස.නි. - සංවර්ධන නිලධාරී
ක.සේ.නි.. - කළමනාකරණ සේවා නිලධාරී
කාර්යාල සේවක සේවය - 08
රියදුරු - 08

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- කෘෂිකාර්මික අංශය
- සේවා අංශය
- ප්‍රතිපත්ති අංශය
- කාර්මාන්ත අංශය
- පාලන හා ගිණුම් අංශය

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - අදාල නොවේ.

2. පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2024 වසරෙහි ලබාගත් ප්‍රගතිය, එයින් රටට හා ජනතාවට ලැබෙන ප්‍රතිලාභ සහ 2025 වසරේදී ලභාකර ගැනීමට අපේක්ෂිත ප්‍රගතිය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් වන 2024 කාර්ය සාධන වාර්තාව සඳහා පෙරවදනක් සැපයීමට ලැබීම මා ලද ගෞරවයක් සේ සළකමි. 2022 හා 2023 වර්ෂයන් මෙන්ම 2024 වර්ෂයද රාජ්‍ය ව්‍යවසායන් කෙරෙහිත්,පොදුවේ ජාතික ආර්ථිකය කෙරෙහිත් අභියෝග රැසක් පැවැති වර්ෂයකි. 2024 වර්ෂයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සළකා බලන විට පහත කරුණු වැදගත් වේ.

රාජ්‍ය ව්‍යාපාරයන්හි මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය කිරීමට අවශ්‍ය තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා හඳුන්වාදුන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ කළමනාකරණ තොරතුරු පද්ධතියට (PEDMIS) රාජ්‍ය ව්‍යාපාර 131 ක තොරතුරු ඇතුලත් කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ සියලු අංශවල නිලධාරීන් දැනුවත් කිරීම සහ අදාළ රාජ්‍ය ව්‍යාපාරයන්හි නිලධාරීන්ට අවශ්‍ය සහාය ලබාදීම අධීක්ෂණ අංශයේ මුලිකත්වයෙන් 2024 වර්ෂය තුළ සිදුකරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ රජය ඇතිකරගත් විස්තීරණ ණය පහසුකම් ගිවිසුමෙහි කොන්දේසි ප්‍රකාරව ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 හි 2023 වසරේ විගණිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සමීපව අධීක්ෂණය මෙම අංශය විසින් සිදු කළ අතර, ඒ අනුව එම විගණිත මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ වෙබ් පිටුවෙහි පල කිරීම සහ ප්‍රගතිය වාර්තා කිරීම සිදු කරන ලදී.

ආයතනික යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි නිර්ණායක වලට අනුකූලව රාජ්‍ය ව්‍යවසායයන් විසින් උපායමාර්ගික සැලසුම් සකස්කර ඇති ආකාරය සමාලෝචනය කළ අතර, එහිදී 2024 වර්ෂයේදී ශ්‍රී ලංකා දේශගුණ අරමුදලෙහි හා දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානයේ උපායමාර්ගික සැලසුම් සමාලෝචනය කිරීම සිදුකරන ලදී.

කළුබොවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, ජාතික ලුණු සමාගම හා ජාතික ප්‍රවාහන කොමිසම යන ආයතනවල කාර්යසාධනය මත පදනම් වූ සේවක දිරිදීමනා යෝජනා ක්‍රම ඇගයීමට ලක් කිරීම සිදුවිය.

වාර්ෂික වාර්තා පිළියෙල කිරීම, විගණනය කල වාර්ෂික ගිණුම් වාර්තා ලබාගැනීමේ ප්‍රමාදයන් සහ අඩුපාඩු මගහරවා ගැනීම, ආයතනික යහපාලනය හා කාර්යසාධනය වැඩිදියුණු කිරීම, උපායමාර්ගික සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් ප්‍රවාහන අංශයේ රාජ්‍ය ව්‍යවසායයන් දැනුවත් කිරීම සිදුකරන ලදී.

එසේම, මුදල් අමාත්‍යාංශය යටතට ගැනෙන රාජ්‍ය ව්‍යවසයයන් සහ භාණ්ඩාගාර ලේකම්වරයාට හිමිකාරිත්වයක් ඇති රාජ්‍ය සමාගම් සඳහා සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීමට අදාළ පත්වීම් ලිපි නිකුත් කිරීම අධීක්ෂණ අංශය මඟින් සිදුකරන ලදී.

තවද "රාජ්‍ය ව්‍යවසායයන්හි සාමුහික ගිවිසුම් ක්‍රමවේදය සමාලෝචනය කිරීම" යන මැයෙන් 2/2024 චක්‍ර ලේඛය පිළියෙළ කිරීම මෙන්ම "මහ බැංකු පරිශ්‍රමිකයන් අධ්‍යයනය කිරීම සඳහා අමාත්‍යමණ්ඩලය විසින් පත්කළ කමිටුවේ ලේකම් ලෙස මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරියක සහභාගී වූ අතර එම කමිටුවට අවශ්‍ය සහය එය හරහා ලබා දෙන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ රජය විසින් ඇති කරගත් විස්තීරණ ණය පහසුකම් ගිවිසුම ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධ කොන්දේසි ක්‍රියාත්මක කිරීම පිලිබඳ ප්‍රගති සමාලෝචනය සඳහා මෙම දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ සහභාගී වූ අතර එහිදී අදාළ නිරීක්ෂණ ලබාදීම සිදුකරන ලදී. එමෙන්ම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත, රාජ්‍ය ණය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්, පනත් වල ප්‍රතිපාදන සම්බන්ධ නිරීක්ෂණ ලබාදීම සිදුකරන ලදී.

එසේම මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද 2023 වසරේ වාර්ෂික වාර්තාව, 2024 වසරේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව, වසර මැද රාජ්‍ය මූල්‍ය තත්වය පිළිබිඹු කරන වාර්තාවන්හි රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය පිලිබඳ පරිච්ඡේදය පිළියෙල කිරීම සිදුවිය.

තවද, 2024 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසායයන්හි සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය හා අනෙකුත් ජ්ෙෂ්ඨ නිලධාරීන් වෙත, ආයතනික යහපාලනය සහ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම, උපායමාර්ගික සැලසුම් සකස් කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන් එම ආයතනවල ඉල්ලීම පරිදි සිදුකරන ලදී.

2024 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සාමුහික අභිප්‍රාය ප්‍රකාශය අත්සන් කල අතර, එහිදී එම කාර්යසාධන ගිවිසුම පිළියෙළ කිරීමට අදාල තාක්ෂණික සහාය අධීක්ෂණ අංශය මඟින් ලබා දෙන ලදී.


2024 වර්ෂයේදී රජය සතු සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් රුපියල් මිලියන 33,191 ක අයබදු ආදායමක් රැස්කර ගැනිමට හැකියාව ලැබී ඇත. එය එම වර්ෂයේ ඇස්තමේන්තුවට අනුව සියයට 52 ක ප්‍රමාණයක් වේ. එසේම 2024 වර්ෂයේ රජය සතු සමාගම්වලින් රු.මිලියන 7,889 ක ලාභාංශ ආදායමක් රැස්කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර, එය එම වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 148 ක් වේ.

ඉහත කාර්යයන් සාර්ථක කරගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම්තුමා, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරුන් විසින් ලබාදුන් සහයෝගය මහත් සේ අගය කරන අතර, මහා භාණ්ඩාගාරයේ නිලධරයන්ටත් විශේෂයෙන්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාගේ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදීතාව පළකර සිටිමි.



3 පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



එසිජ්-එස්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

අපේක්ෂිත අයවැය ප්‍රක්ෂේපන 2024		සටහන	තක්ෂ 2024	2023	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		41,080,424,465	75,701,120,763	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිජ්-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	41,080,424,465	75,701,120,763	
69,533,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		41,080,424,465	75,701,120,763	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		178,101,727,294	263,312,929,972	එසිජ්-3
-	නැන්පතු		3,947,645	345,475	එසිජ්-4
-	අත්තිකාරම් ගිණුම්		5,322,761	6,885,550	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		90,270,024,212	334,559,087,285	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**268,381,021,911**	597,879,248,281	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**309,461,446,376**	673,580,369,044	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,000,000,000	33,378,088	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		308,461,446,376	673,546,990,956	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
78,145,850	වැටුප්, වෙතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	75,441,533	65,348,699	
799,949,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	795,550,310	511,649,673	එසිජ්-2(ii)
130,001,900,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	121,919,854,825	1,726,882	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
130,879,994,850	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**122,790,846,677**	578,725,254	
	මූලධන වියදම්				
731,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	730,318	-	
1,530,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,529,096	1,558,734	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිජ්-2(ii)
333,805,415,000	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	69,424,289,106	263,847,084,631	
970,000	හැකියා වර්ධනය	14	909,580	840,005	
2,000,000,000	වෙනත් මූලධන වියදම්	15	1,995,778,276	5,156,049,275	
335,808,646,000	**මුළු මූලධන වියදම් (උ)**		**71,423,263,377**	269,005,532,645	
	නැන්පතු ගෙවීම්		3,077,646	348,975	එසිජ්-4
	අත්තිකාරම් ගෙවීම්		7,123,380	5,173,760	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		90,270,024,212	333,536,806,685	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		90,280,225,237	333,542,869,419	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		284,494,308,281	603,127,127,318	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		23,967,138,094	70,419,863,639	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		23,966,573,709	70,419,863,639	එසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		564,385	-	එසිජ්-3
			23,967,138,094	70,419,863,639	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්සා 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	39,751,844	38,222,748
මූල්‍ය වත්කම්			
[illegible] ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	11,596,705	9,796,086
[illegible] හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	564,385	-
මූල්‍ය වත්කම්		**51,912,934**	**48,018,834**
මූල්‍ය වත්කම් / ස්කන්ධය			
[illegible]කාරය වෙත ශුද්ධ වත්කම්		10,726,706	9,796,086
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		39,751,844	38,222,748
[illegible] වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
වගේ වගකීම්			
[illegible] ගිණුම්	ඒසිඒ-4	869,999	-
[illegible] ශේෂය	ඒසිඒ-3	564,385	-
මූල්‍ය වගකීම්		**51,912,934**	**48,018,834**

[illegible] අංක 7 සිට 24 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් [illegible] අංක 25 සිට 29 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය [illegible] සිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක [illegible]/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා [illegible] ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන [illegible] මෙයින් සහතික කරමු.

[illegible] තුලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා [illegible] පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය [illegible] වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

[illegible] ගණන්දීමේ නිලධාරි
[illegible]:
[illegible]:
දිනය : 30.05.2025

ගණුම්දීමේ නිලධාරි
නම : ඩබ්.ජී.එම්. උදානන්ද
තනතුර : ගි.ම (බි.ධ)
දිනය : 30/05/2025

ප්‍රධාන ~~මූල්‍ය~~ නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 30/05/25

කේ.එම්.මහින්ද සිරිවර්ධන
[illegible] භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ [illegible] සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

Director General (Act.)
Department of Public Enterprises
General Treasury
Colombo 01.

ඩී.එන්. අලස්
සහකාර අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ - 01.

2

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	නෝට්	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
[illegible]		-	-
[illegible], අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
[illegible]		-	-
[illegible]		-	5,276,049,275
[illegible]		3,737,035	4,066,330
[illegible]		178,101,727,294	263,312,929,972
[illegible]		5,485,468	7,343,852
[illegible]		3,947,645	345,475
[illegible]		90,270,024,212	334,559,087,285
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		**268,384,921,653**	**603,159,822,189**
ආයෝජන : මුදල් වැය කිරීම්			
[illegible]		870,745,718	576,689,172
[illegible]		121,919,854,825	1,726,882
[illegible]		548,388	216,900
[illegible]		1,000,000,000	33,378,088
[illegible]		7,123,380	5,122,843
[illegible]		3,077,646	348,975
[illegible]		90,270,024,212	333,536,806,685
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		**214,071,374,168**	**334,154,289,544**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		**54,313,547,485**	**269,005,532,645**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
[illegible]		-	-
[illegible]		-	-
[illegible]		-	-
[illegible]		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
මූල්‍යකරණ : මුදල් වැය කිරීම්			
[illegible]		54,312,983,100	269,005,532,645
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		**54,312,983,100**	**269,005,532,645**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)		**(54,312,983,100)**	**(269,005,532,645)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		**564,385**	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
[illegible]		-	-
[illegible]		-	-
[illegible]		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-	-
මූල්‍යකරණ : මුදල් වැය කිරීම්			
[illegible]		-	-
[illegible]		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		**564,385**	-
[illegible] 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	-
[illegible] 31 දිනට අවසාන මුදල් ශේෂය		**564,385**	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.)	සංශෝධිත ඇස්තමේන්තුව (රු.)	ප්‍රමාණය (රු.)	මුල් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.03.00	ලාභ	64,192,000,000	--	33,190,901,921.91	52%
2002.04.00	ලාභාංශ	5,341,000,000	--	7,889,522,543.08	148%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	874,230,000.00	880,642,000.00	872,103,265.01	99.03%
ප්‍රාග්ධන	501,623,655,000.00	526,278,646,000.00	71,421,658,336.44	13.57%

3.7 මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.)	සංශෝධිත ප්‍රතිපාදන (රු.)		
--	--	--	--	--	--	--

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1047,564.35	104764.35	--	100%
9152	යන්ත්‍රෝපකරණ	38,704,279,62	38,704,279.62	--	100%
9153	ඉඩම්		-		
9154	අස්පෘශ්‍ය වත්කම්		-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	අදාළ	-		
9160	කෙරීගෙන යන වැඩ	නොවේ	-		
9180	බදු දෙන ලද වත්කම්		-		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීපීඩී/ඒ/පීඊඩී/එෆ්ඒ/2024/15 මඹේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2025 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරි

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 241 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරම්.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

3.1.1 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

2015 ජුනි 22 දිනැති 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකතනය සහ ඇස්තමේන්තු සකස් කිරීම් විධිමත් පරිදි සිදු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) ආදායම් සංකේතාංකය **20:02:03:00** - ලාභ

(i) 2024 වර්ෂය සඳහා ලාභ ආදායම් සංකේතාංක 20.02.03.00 වෙනුවෙන් ඇස්තමේන්තුගත ආදායම රු.64,192,000,000 ක් වූ අතර තත්‍ය ආදායම රු.33,190,901,922 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 51 ක් පමණක් වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 18 ක් මඟින් රු.මිලියන 16,518 ක ආදායමක් අයකර ගැනීමට ඇස්තමේන්තු කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළදී එම ආයතන මඟින් කිසිදු ආදායමක් රැස් කරගෙන නොතිබුණි.

(iii) ලාභ ආදායම් සංකේතාංක 20.02.03.00 ට අදාලව රාජ්‍ය ව්‍යවසායන් 08 ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම සියයට 13 ත් 94 ත් අතර පරාසයක පැවතුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 11 කට අදාලව ලාභ ආදායම් ඇස්තමේන්තුකර නොතිබුණත්, එම ව්‍යවසායන්ගෙන් රු.මිලියන 2,952.5 ක ලාභ ආදායමක් ලැබී තිබුණි.

(v) සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය ව්‍යවසායන් 10 කින් ඇස්තමේන්තු කරන ලද ලාභ ආදායමට වඩා වැඩියෙන් සියයට 46 ක සිට 1,900 දක්වා පරාසය ලාභ ප්‍රමාණයකින් ආදායමට දායක වී තිබුණි.

(ආ) **ආදායම් සංකේතාංකය 20:02:04:00 - ලාභාංශ ආදායම**

(i) 2024 වර්ෂයේ ආදායම් සංකේතාංක 20.02.04.00 - ලාභාංශ ආදායම් සඳහා ඇස්තමේන්තුගත ආදායම රු.5,341,000,000 ක් වූ අතර තත්‍ය ආදායම රු.7,889,520,000 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රු.2,548,520,000 ක් රැස් කරගෙන තිබුණි. ඒ අනුව, එය ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 48 ක වැඩිවීමකි.

(ii) රාජ්‍ය ව්‍යවසායන් 16 කින් රු. මිලියන 1,140 ක ලාභාංශ ආදායමක් ඇස්තමේන්තුකර තිබුණද එම ආයතන වලින් සමාලෝචිත වර්ෂය තුළදී ලාභාංශ ආදායමට කිසිදු දායකත්වයක් ලබා දී නොතිබුණි.

(iii) රාජ්‍ය ව්‍යවසායන් 07 ක ලාභාංශ ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම සියයට 3 ත් 92 ත් අතර පරාසයක පැවතුණි.

(iv) රාජ්‍ය ව්‍යවසායන් 10 කින් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ලාභාංශ ආදායම ඉක්මවා සියයට 24 ක සිට සියයට 900 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභාංශ ආදායමට දායක වී තිබුණි.

(v) 2024 වර්ෂයේ ඇස්තමේන්තුගත ලාභාංශ ආදායමට ඇතුලත් නොකරන ලද රාජ්‍ය ව්‍යවසායන් 6 ක්, සමාලෝචිත වර්ෂය තුළදී ලාභාංශ ආදායමට රු.මිලියන 3,368 කින් දායක වී තිබුණි.

(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 5.3 ඡේදය ප්‍රකාරව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද නුබුන්වත් බව සහතික කරන රාජ්‍ය සමාගම්වල බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට ගෙන්වා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය සමාගම් 11 කට අදාළව 2023 වර්ෂයේ ලාභාංශ වලින් එකතුව රු.මිලියන 13,010 ක් වූ ලාභාංශ ආදායමක් එකතු කරගෙන නොතිබුණි.

3.2 වියදම් කළමනාකරණය

(අ) මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී වැය විෂයන් 12කට අදාළව විචලතාවය සියයට 83ක අඩුවීමේ සිට සියයට 100ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයන් 15ක් සහ මූලධන වැය විෂයයන් 02ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කල පසු රු.272,470,396,376 ඉතිරියක් පැවති අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 79 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඇ) 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව අරපිරිමැසුම්දායි ලෙස රජයේ වියදම් දැරීමක්, වියදම් අවම කිරීම සඳහා වන රෙගුලාසි හා චක්‍රලේඛ දැඩිව පිළිපැදීමක් මඟින් වියදම් පාලනය සඳහා වන ක්‍රියාමාර්ග භාවිත කළ යුතු බව දන්වා තිබූ අතර සුවිශේෂී අවස්ථාවන්හි දී හැර වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව තුල පමණක් වියදම් දැරීම සඳහා බැඳීම් ඇතිකර ගත යුතු බව දන්වා තිබුණි. කෙසේ වුවද, වැය ශීර්ෂය 1508 (වෙනත්) සඳහා 2024 දෙසැම්බර් 11 දින පරිපූරක ඇස්තමේන්තුව මඟින් රු.130,000,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන සම්පූර්ණ වශයෙන් උපයෝජනය කර නොතිබුණු අතර රු.8,081,294,498 ක් එනම්, සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 6 ක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි.

(ඈ) 2024 දෙසැම්බර් 31 දිනට මුදල් රෙගුලාසි 66 යටතේ වැය ශීර්ෂයන් 02ක් සඳහා සිදු කරන ලද ප්‍රතිපාදන මාරු කිරීම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණ වශයෙන් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.

3.3 බැරකම් හා බැඳීම් වලට එළඹීම

මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ මිලදී ගෙන තිබූ වාහන 3ක් සඳහා 2024 දෙසැම්බර් මාසයවෙනුවෙන් ගෙවීමට නියමිතව තිබූ කුලී එකතුව රු.969,291ක් 2024 වර්ෂයේ බැරකම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර 2025 ජනවාරි මාසය තුළදී පියවා තිබුණි.

3.4 පොදු තැන්පත්

2024 ජූලි හා සැප්තැම්බර් මාසවල පොදු තැන්පත් ලේඛනයේ ලැබීම් වල මුළු එකතුව පිළිවෙලින් රු.2,600 ක් හා රු.3,782,024 ක් ලෙස සටහන් කර තිබුණි. කෙසේ වුවද, අදාල භාණ්ඩාගාර මුද්‍රිතවල එය පිළිවෙලින් රු.3,200ක් හා රු.2,519,216 ක් ලෙස සටහන් කර තිබුණි.

3.5 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි

4. මෙහෙයුම් සමාලෝචනය

රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා කළමනාකරණයට උපදෙස් ලබා දීම හා අධීක්ෂණය කිරීමත්, ඒවහී සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාවය සහ ආර්ථිකභාවය සහතික කරමින් අරමුණු කරා මෙහෙයවීමත්, එකී ආයතනවල යහපාලනය වැඩිදියුණු කිරීමත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයක් වී තිබුණ ද එම කාර්යභාරය ඉටු කිරීමට දෙපාර්තමේන්තුව විසින් සාධනීය ලෙස මැදිහත්වී නොමැති අවස්ථා නිරීක්ෂණය විය.

(අ) මහා භාණ්ඩාගාරය විසින් 2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන් 06 ක් වෙනුවෙන් ප්‍රාග්ධන දායකත්වය ලෙස රු.මිලියන 218,245 ක් සපයා තිබුණි. එම ආයෝජනයේ වටිනාකම 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 204,367ක් වූ අතර, එක් එක් ආයතන වල මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට ඒවායේ ශුද්ධ වත්කම් (මුළු වත්කම් - මුළු බාහිර වගකීම්) වල අගය සෘන රු.මිලියන 412,450 ක් වී තිබුණි. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධන දායකත්වය වත්කමක් ලෙස දක්වා ඇති නමුත්, එහි වටිනාකම පූර්ණ වශයෙන් අපහායනය (impairment) වී, අදාළ ආයතන මුළුමනින්ම බාහිර වගකීම් යටතේ පවත්වාගෙන යන තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භක හා අවසාන දිනට රු.මිලියන 1,935,429 ක රජයේ ප්‍රාග්ධන වටිනාකමක් සහිත රාජ්‍ය ව්‍යවසායන් 05 ක 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් රු.මිලියන 550,744 ක් පමණක් විය. ඒ අනුව මෙම රාජ්‍ය ව්‍යවසායන් වල කර ඇති ආයෝජනය අපහායනයට (impairment) ලක් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) නියැදි පරීක්ෂාවන් අනුව, රජය සතු සංස්ථා 04 ක් 2022 වර්ෂයට අදාළව රු. .මිලියන 291 ක ලාභයක් වාර්තා කර තිබුණද 2023 වර්ෂයේදී රු. මිලියන 3,199 ක අලාභයක් වාර්තා කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) නියැදි පරීක්ෂාවන් අනුව, 2022 වර්ෂයේදී අලාභයන් වාර්තා කර තිබූ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සමාලෝචිත වර්ෂයේදී ද අලාභයන් වාර්තා කර තිබූ අතර, ඒ අතුරින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අලාභයන් පිළිවෙලින් සියයට 358 ක් හා 161 කින් ඉහළ ගොස් තිබුණි.

(ඉ) නියැදි පරීක්ෂාවන් අනුව, 2022 වර්ෂයේදී රු. මිලියන 133 ක ශුද්ධ ලාභයක් වාර්තා කර තිබූ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 168 ක ශුද්ධ අලාභයක්ද, පෙර වර්ෂයේදී රු. මිලියන 5 ක ශුද්ධ අලාභයක් වාර්තා කර තිබූ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 156 ක ශුද්ධ අලාභයක්ද ලබා තිබූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව එම අලාභය සියයට 2,799 කින් වැඩි වී තිබුණි.

(ඊ) 2023 වර්ෂය අවසාන වන විට රාජ්‍ය ව්‍යවසායන් 08 කට අදාළව ජංගම අනුපාත දුර්වල තත්ත්වයක පැවතුණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සහ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවේ ජංගම අනුපාතය පිළිවෙලින් 0.15 ක් හා 0.17 ක් වැනි ඉතාමත් පහළ අගයක පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන් ද්‍රවශීලතා දුෂ්කරතාවයන්ට මුහුණදීමේ ඉහළ අවධානමක් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(උ) 2023 වර්ෂය අවසාන වන විට රාජ්‍ය ව්‍යවසායන් 16 ක් සම්බන්ධයෙන් අධි ප්‍රාග්ධන තෝලන තත්ත්වයක් නිරීක්ෂණය විය. මෙහි ඇතැම් ආයතනවල රජයේ ප්‍රාග්ධනය දායකත්වයට වඩා ගෙවීමට ඇති දිගුකාලීන ණය ඉහළ අගයක් ගෙන තිබුණි. තවද රජයේ ප්‍රාග්ධන දායකත්වය සෘන අගයක් ගෙන ඇති රාජ්‍ය ව්‍යවසායන්ද නිරීක්ෂණය වූ අතර එම ආයතන මුළුමනින්ම දිගුකාලීන ණය මඟින් මූල්‍යනය කර තිබුණි. ඒ අනුව මෙම සියළු ආයතන ඉහළ මූල්‍ය අවධානමකට (Financial Risk) මෙන්ම

අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානමකට මුහුණ දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(උ) රාජ්‍ය ව්‍යවසායන් 21 කට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව ප්‍රාග්ධන දායකත්වය සහ 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රජයේ ප්‍රාග්ධන දායකත්වය අතර රු.මිලියන 25,898 ක වෙනසක් නිරීක්ෂණය විය.

(එ) 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල සෘජු ශේෂ සනාථ කිරීම් සහ රජයේ මූල්‍ය ප්‍රකාශන අතර ආයතන 5 කට අදාළව රජයට අයත් කොටස් සංඛ්‍යාවෙහි වෙනස්කම් නිරීක්ෂණය වූ අතර රජයේ මූල්‍ය ප්‍රකාශන තුල එදිනට රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.476,986 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඒ) Sri Lanka Institute of Biotechnology (Pvt) Ltd ආයතනයෙන් ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2024 දෙසැම්බර් 31 දිනට කොටසක මිල රු.10 ක් වූ කොටස් 52,472,574 ක් මහා භාණ්ඩාගාරය සතු බව සඳහන් කර තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 525 ක් විය. කෙසේ වුවද, 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව මෙම අගයට අමතරව රු.මිලියන 772 ක ප්‍රාග්ධන දායකත්ව ශේෂයක් පැවතුණි.

(ඔ) රාජ්‍ය ව්‍යවසායන් 08 කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 1,150,312 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 1,167,570 ක් වීම හේතුවෙන් එ් අතර රු.මිලියන 17,258 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) රාජ්‍ය සමාගම් 06 කට අදාළ භිමිකාරිත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නාමික අගය අනුව ගණනය කිරීමේදි 2024 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන 6,549 ක් වුවද, එය රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 15,893 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 9,344 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ක) රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුල රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 87,285 ක් වූ අතර ඉන් රු.මිලියන 33,674 ක් එනම් සියයට 38 ක් එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොළී ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල් වලින් සමන්විත වී තිබුණි.

(ග) රාජ්‍ය ව්‍යවසායන් 09 කට අදාළව ඉදිරිපත් කළ සෘජු ශේෂ සනාථ කිරීම් අනුව හා රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම රාජ්‍ය ව්‍යවසායන් වලට අදාළව මහා භාණ්ඩාගාරයට අයත් කොටස් හිමිකාරිත්වයේ ප්‍රතිශතයන් හි වෙනස්කම් නිරීක්ෂණය විය.

(ච) 2024 දෙසැම්බර් 31 දිනට Asian Reinsurance Corporation හි කොටසක් ඇ.ඒ.ජ. ඩොලර් 1000 ක් වූ කොටස් 980 ක, Ceylon Shipping Agency කොටසක් SGD 1ක් වූ කොටස් 24,500 හා International Finance Corporation හි කොටසක් ඇ.ඒ.ඩො. 1,000 ක් වූ කොටස් 7,491 ක් සමන්විත රජයේ ආයෝජනයේ වටිනාකම රු.2,447,598,475 ක් වී තිබුණි.

(ඡ) "මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම" යන ප්‍රධාන කාර්යය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ආයතන වල වාර්ෂික වාර්තා නියමිත දිනවල පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් විය. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන ආයතන 305 ක් පැවතිය ද, දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ඉදිරිපත් කර තිබුණේ දෙපාර්තමේන්තුව ක්‍රමෝපායිකව වැදගත් ලෙස සලකන ලද ආයතන 52කට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අදාළ තොරතුරු පමණි.

(i) 2021 වර්ෂයේදී හඳුන්වා දෙන ලද Operational Manual for State Owned Enterprises මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6 පරිච්ඡේදය පරිදි මූල්‍ය වර්ෂයට අදාළ වාර්ෂික වාර්තා වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත විගණන වාර්තාව සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, විගණිත දිනය වූ 2025 මැයි 21 දින වන විට 2023 වර්ෂය වෙනුවෙන් එකී රාජ්‍ය ව්‍යවසායන් 52 න් පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියේ ඇතුළත් කර තිබුණේ ආයතන 05 කට අදාළ වාර්ෂික වාර්තා පමණි. 2024 වර්ෂය වෙනුවෙන් මේ දක්වා කිසිදු ආයතනයකට අදාළ වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියේ ඇතුළත් කර නොතිබුණි.

(ii) 2021 වර්ෂයේදී හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 පරිච්ඡේදය පරිදි වාර්ෂික කාර්යය සාධන ඇගයීම් රැස්වීමේ දී වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ද ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ද ඉතා පහල මට්ටමක පැවතුන බව නිරීක්ෂණය විය.

5. මානව සම්පත් කළමනාකරණය

2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති තනතුරු පුරප්පාඩු 04ක් අතරින්ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 01 ක් ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 03ක් ද පැවතුණු අතර ද්විතික මට්ටමේ තනතුරු 02ක් අතිරික්තව පවතින අතර එය සංවර්ධන නිලධාරි තනතුරුවලින් සමන්විත වී තිබුණි. කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර පවතින පුරප්පාඩු පිරවීමට හෝ අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට හෝ සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

ඩී.පී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4.පරිච්ඡේදය – කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (2024 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම				
	150% - 101%	100% - 90%	89% - 75%	74% - 50%	49% - 0%
1. රාජ්‍ය ව්‍යාපාර වල යහපාලනය දියුණු කිරීම.					
1.1.රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහ මූල්‍ය විනය ස්ථාපිත කිරීම සඳහා මඟ පෙන්වීම සහ නියෝග නිකුත් කිරීම.					
සාමුහික ගිවිසුම් වලට අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීම.					
චක්‍රලේඛ සංඛ්‍යාව.		100%			
මාර්ගෝපදේශ සංඛ්‍යාව.					
අත්පොත් සංඛ්‍යාව					
1.2. පරිපාලන අත්පොත් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම					
පරිපාලන අත්පොත් සංඛ්‍යාව					
1.3 ප්‍රතිපත්තිමය කාරණා හැසිරවීම					
හසුරුවන ලද ප්‍රතිපත්තිමය කාරණා සංඛ්‍යාව		100%			
1.4. පෞද්ගලීකරණයෙන් පසු ගැටළු හැසිරවීම					
හසුරුවන ලද ගැටළු සංඛ්‍යාව		100%			
1.5. ආයතන අවසන් කිරීමේ ගැටළු					
පැවැත්වූ රැස්වීම් ගණන		100%			
ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකා සංඛ්‍යාව					
1.6 කාර්ය සාධන පනත යටතේ ක්‍රියාකාරකම්					
2. රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.					
2.1.ඉහළ, මධ්‍යම හා පහළ මට්ටම්වල ප්‍රමුඛතා අධීක්ෂණ මත පදනම්ව රාජ්‍ය ව්‍යාපාරවල සැලසුම් අධීක්ෂණය කිරීම.					
රාජ්‍ය ව්‍යාපාරවල ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම/හඳුනාගත් ගැටළු ප්‍රමාණය	101%				
රැස්වීම් කැඳවීම හෝ අවශ්‍ය පරිදි ගැටළු සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල සමඟ සන්නිවේදනය කිරීම.					
පැවැත්වූ රැස්වීම් ගණන		93%			

ආයතනික සැලසුම්, ක්‍රියාකාරී සැලසුම් හා 2024 වාර්ෂික අයවැය වාර්තා සමාලෝචනය කර අවශ්‍ය අවස්ථාවලදී රාජ්‍ය ව්‍යාපාර සමඟ සාකච්ඡා කිරීම.					
සමාලෝචනය කරන ලද සැලසුම් ප්‍රමාණය			86%		
2.2. රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය කාලානුරූපීව අධීක්ෂණය කිරීම.					
අධීක්ෂණ ආකෘති සංවර්ධනය කිරීම සහ කාර්යසාධන වාර්තා සකස් කිරීම					
සකස් කරන ලද කාර්ය සාධන වාර්තා ගණන			88%		
අයවැය සහ තත්‍ය අතර හිඩැස් හඳුනාගැනීම					
සමාලෝචනය කරන ලද කාර්ය සාධන වාර්තා ගණන			78%		
අවශ්‍යතම් හේතු විමසීම සහ නිවැරැදි ක්‍රියාමාර්ග ගැනීම		90%			
2.3. ව්‍යාපාරික යෝජනා ඇගයීම සහ විශ්ලේෂණය කිරීම					
ඇගයීම සහ විශ්ලේෂණය කරන ලද යෝජනා ගණන		97%			
2.4.අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සහ අදහස් සම්පාදනය කිරීම.					
අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සංඛ්‍යාව		90%			
2.5. රාජ්‍ය ව්‍යාපාර වල ගැටලු හැසිරවීම/ නිරාකරණය කිරීම					
ලියා ඇති ලිපි සංඛ්‍යාව		92%			
සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව / වාර්තා සංඛ්‍යාව		96%			
සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා ගණන		85%			
3.කොටස්කරුවන්ගේ අභිලාෂය ආරක්ෂා කිරීම					
3.1. වාර්ෂික අයවැය, උපායමාර්ගික සැලැස්ම සහ මූල්‍ය තත්ත්වය සැළකිල්ලට ගෙන රාජ්‍ය ව්‍යාපාරවල බදු /ලාභාංශ ඇස්තමේන්තු කිරීම.					
ඇස්තමේන්තු සංඛ්‍යාව සහ අයබදු හා ලාභාංශවලින් අපේක්ෂිත මුළු වටිනාකම				52%	
3.2. 2024 වර්ෂයේ අයබදු සහ ලාභාංශ එකතු කිරීම					
2024 වර්ෂයේ අයබදු සහ ලාභාංශ මුළු මුදල	148%				
3.3. සහභාගී වූ වාර්ෂික මහා සභා රැස්වීම් සහ අතිවිශේෂ මහා සභා රැස්වීම්.					
සහභාගී වූ වාර්ෂික මහා සභා රැස්වීම් සහ අතිවිශේෂ මහා සභා රැස්වීම් සංඛ්‍යාව		87%			
3.4. රාජ්‍ය ව්‍යාපාර ගැටලු සම්බන්ධයෙන් විගණකාධිපති/ බාහිර විගණකවරු ඵලදායී විගණන අධීක්ෂණය සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැපයීම					

සිදු කරන ලද විගණන ගැටළු පිළිබඳ සන්නිවේදන සංඛ්‍යාව			81%		
3.5. මුදල් පනතේ ප්‍රතිපාදන වලට අදාළව රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමාගේ එකඟතාවය ලබාදීම					
ලද ඉල්ලීම් ලිපි සංඛ්‍යාව සහ යවා ඇති එකඟතා ලිපි සංඛ්‍යාව		95%			
3.6. භාණ්ඩාගාරයේ අභිලාෂය ආරක්ෂා කිරීමට යටත්ව, ප්‍රධාන ගනුදෙනු සඳහා අනුමැතිය ලබාදීම.					
අනුමත ප්‍රධාන ගණුදෙනු සංඛ්‍යාව		95%			
3.7. භාණ්ඩාගාර නියෝජිත රැස්වීම් පැවැත්වීම					
සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව			80%		
පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව					
3.8 ප්‍රාදේශීය වතු සමාගම් නියෝජිතයන් සමඟ ස්වර්ණමය හිමිකාරීත්ව රැස්වීම් සඳහා සහභාගී වීම.					
සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව					
3.9 සාමූහික අභිප්‍රාය ප්‍රකාශය (SCI)					
SCI අත්සන් කිරීම සඳහා SOEs හඳුනා ගැනීම		100%			
SCI ගිවිසුම් සකස් කිරීම		100%			
SCI ගිවිසුම් අත්සන් කිරීම		100%			
SCI ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, මාසිකව සහ ද්වි-වාර්ෂිකව		100%			
4.මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම					
4.1. පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට සහාය වීම.					
පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා වාර්තා සකස් කිරීම					
සකස් කරන ලද පාර්ලිමේන්තු කාරක සභා වාර්තා ප්‍රමාණය			85%		
අදාළ රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් සඳහා සහභාගී වීම					
සහභාගී වූ පාර්ලිමේන්තු කාරක සභා ප්‍රමාණය				74%	
රාජ්‍ය ව්‍යාපාර විසින් පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම.					
එවන ලද පසු විපරම් සංඛ්‍යාව				74%	
පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා වාර්තා සම්බන්ධයෙන් (මධ්‍යකාලීන/අවසන්)ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ					

ඉදිරිපත් කළ නිරීක්ෂණ වාර්තා ප්‍රමාණය				67%	
4.2. වාර්ෂික වාර්තා නියමිත කාලසීමාව තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම					
අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් ලියන ලද නිරීක්ෂණ සංඛ්‍යාව			86%		
පාර්ලිමේන්තුවට ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම			79%		
4.3. රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම					
ක්‍රියාත්මක කරන ලද යෝජනා සංඛ්‍යාව	105%				
සංවිධානය කරන ලද පසු විපරම් රැස්වීම් සංඛ්‍යාව		100%			
4.4. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් සහ මුල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම					
අදාල ආයතනවලට 2024 රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ශ්‍රේණියේ ගිණුම් සහ මුල්‍ය ප්‍රකාශන නියමිත කාල සීමාව තුල විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.		100%			
4.5. 2024 කාර්ය සාධන වාර්තාව සකස් කර නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීම					
නියමිත කාලසීමාව තුළ කාර්ය සාධන වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම		100%			
4.6. මුදල් අමාත්‍යාංශයේ 2024 වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර සඳහා අදාළ පරිච්ඡේදය සකස් කිරීම					
මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර සඳහා අදාල පරිච්ඡේදය නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීම		100%			
4.7. 2024 මුල්‍ය කළමනාකරණ වගකීම් පනතට අදාළ වාර්තා සඳහා රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් වූ පරිච්ඡේදය සකස් කිරීම					
2024 මුල්‍ය කළමනාකරණ වගකීම් පනතට අදාලව රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය දැක්වෙන පරිච්ඡේදය නියමිත කාලසීමාව තුල ඉදිරිපත් කිරීම		100%			
4.8. මහ බැංකු වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම					
මහ බැංකු වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම		100%			
4.9. මහ බැංකු අර්ධ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාල පරිච්ඡේදය පිලියෙල කිරීම					
මහ බැංකු අර්ධ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම		100%			

4.10. මධ්‍ය වාර්ෂික මූල්‍ය තත්ත්ව වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කිරීම					
මධ්‍ය වාර්ෂික මූල්‍ය තත්ත්ව වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම		100%			
4.11.කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම					
දෙපාර්තමේන්තුවේ දැනට සේවය කරන නිලධාරීන්ගේ, සහ වසර තුළ ස්ථානමාරුවීම් ලබා පැමිණෙන සහ පිටව යන සියලුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම.		100%			
4.12. කාර්ය මණ්ඩලයේ වැටුප් වර්ධක සකස් කිරීම					
සුදුසුකම් සපුරන සියලුම නිලධාරීන්ගේ වැටුප් වර්ධක ලබාදීම.		100%			
4.13. පවතින ක්‍රමවේද සමග අනුගත වෙමින් කාර්ය මණ්ඩලයේ ණය ඉල්ලුම්පත් අනුමත කිරීම					
පවතින ක්‍රමවේද සමග අනුගත වෙමින් කාර්ය මණ්ඩලයේ ණය ඉල්ලුම්පත් අනුමත කිරීම		100%			
4.14.නිලධාරීන්ගේ නිවාඩු වාර්තා යාවත්කාලීන කිරීම					
සියලුම නිලධාරීන්ගේ නිවාඩු යාවත්කාලීන කිරීම.		92%			
4.15.ප්‍රසම්පාදන සැලැස්ම සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීම					
ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සහ එය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම.		90%			
4.16.දෙපාර්තමේන්තු වාහන සංචිතය කළමනාකරණය කිරීම					
දෙපාර්තමේන්තු වාහන සංචිතය නිසි කළමනාකරණයකින් යුතුව පවත්වා ගැනීම.		100%			

4.17.දෙපාර්තමේන්තුවට ලැබුණු ලිපි කළමනාකරණය කිරීම

ලැබෙන සියලුම ලිපි අදාල අංශ වලට යොමු කිරීම		100%			
4.18.කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්					
නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන අවශ්‍යතාවය මත නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම.		100%			
4.19.කාර්ය මණ්ඩලය විසින් ඉල්ලුම් කරන ලද මුළු දීමනා සහ දුම්රිය බලපත්‍ර ප්‍රමාණය					
කාර්ය මණ්ඩලය විසින් ඉල්ලුම් කරන ලද මුළු දීමනා සහ දුම්රිය බලපත්‍ර ප්‍රමාණය ප්‍රමාදයකින් තොරව ලබාදීම.		100%			
4.20.දෙපාර්තමේන්තුව තුළ කාර්යක්ෂම ගිණුම් පද්ධතියක් පවත්වාගෙනයාම පිළිබඳ වගකීම					

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්ක/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0% - 49%	50% - 74%	75% - 100%
1. ඵලදායිතා ක්‍රියාකාරකම්වලට අනුකූලව ව්‍යවසායකත්ව සහ නිර්මාණශීලීත්වයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමේ අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර කුඩා පරිමාණ සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරි ගැන්වීම. (SDG.8.3)	1.ආර්ථික ඵලදායිතාවය හා නවෝත්පාදන 2.කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විධිමත් කිරීම. 3.රැකියාගත වීම හා සුනිසි රැකියා 4.මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය	රාජ්‍ය ව්‍යවසායන් වලට අත්‍යාවශ්‍ය සේවකයින් බඳවා ගැනීම සඳහා චක්‍ර ලේඛ ප්‍රකාරව අනුමැතීන් ලබාදීම. ව්‍යාපාර සැලසුම් අධ්‍යනය කර ඵලදායිතා ඉහළ නැංවීම හා නවෝත්පාදන ප්‍රවර්ධනය සඳහා දිරි ගැන්වීම. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දියුණු කිරීම සඳහා රාජ්‍ය බැංකු සම්බන්ධීකරණය		√ √	√

2. සියලු සමාගම් තිරසාර සංවර්ධනයක් යොදා ගැනීමට පෙළඹවීම සහ ඔවුන්ගේ වාර්තා කිරීමේ ක්‍රියාවලියට තිරසාර තොරතුරු ඒකාබද්ධ කිරීම. (SDG.12.5)	12.6.1 තිරසාරමය වාර්තා ප්‍රකාශ කිරීමට පෙළඹවීම.	විශාල හා ජාත්‍යන්තර රාජ්‍ය ව්‍යාපාර තිරසාරමය වාර්තා ප්‍රකාශ කිරීමට පෙළඹවීම. 1.ලංකා බැංකුව 2.මහජන බැංකුව 3.ජාතික ඉතිරි කිරීමේ බැංකුව 4.ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 5.රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව 6.නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව 7.ලංකා විදුලිබල මණ්ඩලය 8.ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 9.ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය 10.ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ් 11.ගුවන් තොටුපල සහ ගුවන් සේවා ශ්‍රී ලංකා පුද්ගලික සමාගම 12.ශ්‍රී ලංකා වරාය අධිකාරිය			√
3. ජාතික ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා අනුව තිරසාර මහජන ප්‍රසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම. (SDG.12.7)	12.7.1. සංවර්ධනය ඉලක්ක කරගත් රාජ්‍ය මූල්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති දිරිගැන්වීම.	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට මාරු වීම. e – Procument % මුළු ප්‍රසම්පාදනය		√	

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යාපාරයන්හි යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ නිර්ණායක වලට උපායමාර්ගික සැලසුම්,වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ඇති ආකාරය සමාලෝචනය කිරීම, රාජ්‍ය ව්‍යාපාරයන්හි මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය කිරීම සහ මුදල් අමාත්‍යාංශය යටතට ගැනෙන රාජ්‍ය ව්‍යාපාරයන් සහ භාණ්ඩාගාර ලේකම්වරයාට හිමිකාරීත්වය ඇති රාජ්‍ය සමාගම් සඳහා සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර එම ආයතනයන්හි පරිපාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙනු ලබයි.

උක්ත කර්තව්‍ය තුල රාජ්‍ය ව්‍යාපාරයන්හි මෙහෙයුම් හා කාර්යක්ෂමතාවය සමාලෝචනය කිරීමට අවශ්‍ය තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා හදුන්වා දී ඇති රාජ්‍ය ව්‍යාපාර කළමනාකරණ තොරතුරු පද්ධතියට (PEDMIS) රාජ්‍ය ව්‍යාපාර 131 ක තොරතුරු ඇතුලත් කර යාවත්කාලීන කිරීම හා ඒ මඟින් එම රාජ්‍ය ව්‍යාපාරයන්හි නිලධාරීන්ට තිරසාර යහපත් මූල්‍ය පාලනයක් පවත්වා ගනිමින් මහාභාණ්ඩාගාරයට වැයබරක් නොවී පවත්වා ගෙන යාමට අවශ්‍ය මඟපෙන්වීම සිදු කරනු ලබයි.

එමෙන්ම 2025 වර්ෂයේ ශ්‍රීලංකාවේ ඉලක්කගත තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අධීක්ෂණය කරනු ලබන ආයතනයන්හි තිරසාර සංවර්ධන අරමුණු ලගාකර ගැනීමට සැලසුම් කර ඇති ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මඟපෙන්වීම සිදු කරනු ලබයි.

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය (2024.12.31 දිනට)

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	29	28	01
තෘතීයික	03	03	--
ද්විතියික	37	39	(02)
ප්‍රාථමික	16	13	03

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

නිලධාරීන් විශ්‍රාම යෑම සහ ස්ථාන මාරු ලබා යෑම තුළ සහ 2022 වර්ෂයේදී නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022 (I) හා 14/2022 (II) මඟින් රාජ්‍ය නිලධාරීන් හට දේශීය හා විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට ඇති හැකියාව මත මෙම පුරප්පාඩු සහ අතිරික්ත වීම් ඇති වී තිබෙන අතර මෙම පුරප්පාඩු පිරවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් සිදු කර ඇත.

6.3.මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය (රු.)	විදේශීය		
පුහුණු - 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා						
Speech craft training programme with toastmasters international	05	සති අන්ත	140,000.00	-	දේශීය	ජාත්‍යන්තර toastmasters සමඟ කථන ශිල්ප පුහුණුව පිළිබඳ දැනුම ලබා ගැනීම
විනය කාර්යය පටිපාටි පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	මාස 03	25,000.00	-	දේශීය	විනය කාර්යය පටිපාටි පිළිබඳ දැනුම ලබා ගැනීම
පරිපාලන නිලධාරී ධාරිතා සංවර්ධනය	01	දින 03	15,000.00	-	දේශීය	ධාරිතා සංවර්ධනය පිළිබඳ දැනුම ලබා ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම ලබා ගැනීම
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	03	මාස 03	25,000.00	-	දේශීය	
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ ඩිප්ලෝමාව	01	ඩිප්ලෝමා අවුරුදු 01	75,000.00	-	දේශීය	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම ලබා ගැනීම
හානි පාඩු හා මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය	01	දින 02	13,000.00	-	දේශීය	හානි පාඩු හා මු.රෙ.104 සම්බන්ධ දැනුම
ඵලදායිතා උසස් සහතික පත්‍ර පාඨමාලාව	01	දින 01	4,000.00	-	දේශීය	ඵලදායිතාවය පිළිබඳ දැනුම ලබා ගැනීම
New trends in labour law	01	දින 01	5,000.00	-	දේශීය	New trends in labour law පිළිබඳ දැනුම ලබා ගැනීම
රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම	02	දින 01	10,000.00	-	දේශීය	රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම

නිවාඩු භාර නිළධාරීයාගේ කාර්යභාරය හා වගකීම	01	දින 01	5,000.00	-	දේශීය	නිවාඩු භාර නිළධාරීයාගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ දැනුම ලබා ගැනීම
පෞද්ගලික ලිපි ගෙනුවක් ඵලදායී ලෙස පවත්වාගෙන යාම	02	දින 01	10,000.00	-	දේශීය	පෞද්ගලික ලිපි ගෙනුවක් ඵලදායී ලෙස පවත්වාගෙන යාම පිළිබඳ දැනුම ලබා ගැනීම
English official letter writing	04	දින 01	28,000.00	-	දේශීය	English official letter writing පිළිබඳ දැනුම ලබා ගැනීම
කාර්යාල කළමනාකරණ සහ මුදල්රෙගුලාසි	02	දින 02	20,000.00	-	දේශීය	කාර්යාල කළමනාකරණ සහ මුදල්රෙගුලාසි පිළිබඳ දැනුම ලබා ගැනීම
ආයතන සංග්‍රහය විධි විධාන හා පටිපාටික රීති	02	දින 02	26,000.00	-	දේශීය	ආයතන සංග්‍රහය විධි විධාන හා පටිපාටික රීති පිළිබඳ දැනුම ලබා ගැනීම
රිය පැදවීම සහ මාර්ග නීති පිළිබඳ පාඨමාලාව	04	දින 01	24,000.00	-	දේශීය	රිය පැදවීම සහ මාර්ග නීති පිළිබඳ දැනුම ලබා ගැනීම
ධාරිතා සංවර්ධන වැඩමුළුවක් පැවැත්වීම 2024.11.11	සියළු කාර්යය මණ්ඩලය සඳහා	දින 01	60,119.99	-	දේශීය	ධාරිතා සංවර්ධන පිළිබඳ දැනුම ලබා ගැනීම
ධාරිතා සංවර්ධන වැඩමුළුවක් පැවැත්වීම 2024.09.08	සියළු කාර්යය මණ්ඩලය සඳහා	දින 01	413,090.00	-	දේශීය	ධාරිතා සංවර්ධන පිළිබඳ දැනුම ලබා ගැනීම

වෘත්තීය ආයතනවල සාමාජිකත්වය පවත්වාගෙන යාම

CA Sri Lanka වාර්ෂික සමුළුවට සහභාගී වීම	3	වාර්ෂික	96000.00			මූල්‍ය විශ්ලේෂණය පිළිබඳ විශේෂඥ දැනුම සහිත වෘත්තිකයන් පවත්වාගෙන යාම ඊට සමගාමී අනෙකුත් විෂය දැනුම වර්ධනය තුළින් රාජ්‍ය ව්‍යාපාරවල මූල්‍ය
CPFA හා APFA හි වෘත්තීය සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම	3	වාර්ෂික	48000.00			
CIMA වෘත්තීය සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම	2	වාර්ෂික		පවුම් 315 පවුම් 375		

CA Sri Lanka වෘත්තීය සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම	2	වාර්ෂික	40000.00			අංශයේ කටයුතු පිළිබඳ එම ආයතනවලට අවශ්‍ය උපදේශනය හා පුහුණුව ලබා දීම
CMA වෘත්තීය සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම	1	වාර්ෂික	30000.00			
CA Sri Lanka හි පුහුණුව ලබා දෙන ආයතනයක් වශයෙන් වාර්ෂික ගාස්තු ගෙවීම		වාර්ෂික	30000.00			

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය			වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය (රු.)		විදේශීය		
		පුහුණු - 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා					
පව්වාත් උපාධිය සඳහා	01	අවු: 02	-	උණුසුම් ඇදුම් දීමනාව රු.31,299.44	ඇ.ඩො 375	විදේශීය	නිලධාරීන්ගේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර මට්ටමේ දැනුම හා පළපුරුද්ද ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.
Role of Insurance in Financing Climate Risk and National Workshop on Climate Roundtable on Adaptation Financing New Delhi - India	01	දින 04	-	උණුසුම් ඇදුම් දීමනාව රු.30,290.38	ඇ.ඩො 100	විදේශීය	
First Mid – Career Training Programme for Island Services Officers of Sri Lanka under the Indian Technical & Economic Co – operation (ITEC) 2024/2025 India	01	දින 13	රක්ෂණය රු.5,659.29	උණුසුම් ඇදුම් දීමනාව රු.28,591.44	ඇ.ඩො 325	විදේශීය	
First Mid – Career Training Programme for Island Services Officers of Sri Lanka under the Indian Technical & Economic Co – operation (ITEC) 2024/2025 India	01	දින 13	රක්ෂණය රු.5,659.29	උණුසුම් ඇදුම් දීමනාව රු.28,591.44	ඇ.ඩො 325	විදේශීය	
Public Administration Reform Global Forum: Transforming Governments for a Livable Planet Washington DC	01	දින 05	රක්ෂණය රු.4,012.45	උණුසුම් ඇදුම් දීමනාව රු.29,121.94 සංයුක්ත දීමනාව රු.159,586.52	ඇ.ඩො 125	විදේශීය	
0523-0605-Seminar on "Smart Customs, Smart Borders and Smart Connectivity" Innovation and Cooperation for the BRI Countries - China	01	දින 17	-	-	ඇ.ඩො 375	විදේශීය	

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව		සමස්ත ආයෝජනය		වැඩසට හනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
0614 - 0627- Seminar on Financial & Financial Cooperation Management for BRL Countries - China	01	දින 17	-	උණුසුම් ඇදුම් දීමනාව රු.29,445.93	ඇ.ඩො 375	විදේශීය	
Seminar on Optimization of Business Environment for Chambers of Commerce and Industry BRI partner Countries	01	දින 17	-	-	ඇ.ඩො 375	විදේශීය	
Seminar on Investmen t Cooperation and De velopment for Develo ping Countries	01	දින 17	-	-	ඇ.ඩො 375	විදේශීය	
role of Insurance in Financing Climate Risk and National Workshop on Climate Roundtable on Adaptation Financing-India	01	දින 04	-	උණුසුම් ඇදුම් දීමනාව රු.30,290.38	ඇ.ඩො 100	විදේශීය	
Seminar on Renewable Energy Power Sector Standardization Cooperation between China and south Asian Countries - China	01	දින 17	-	-	ඇ.ඩො 375	විදේශීය	
Third Mid-Career Training Programme for Island Services Officers of Sri Lanka under the Indian Technical & Economic Co-operation (ITEC) **2024/2025 -** India	01	දින 15	-	-	ඇ.ඩො 350	විදේශීය	නිලධාරීන්ගේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර මට්ටමේ දැනුම හා පළපුරුද්ද ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.
Third Mid-Career Training Programme for Island Services Officers of Sri Lanka under the Indian Technical & Economic Co-operation (ITEC) **2024/2025 -** India	01	දින 15	-	උණුසුම් ඇදුම් දීමනාව රු.30,201.62	ඇ.ඩො 350	විදේශීය	

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය			වැඩසට හනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
Seminar on Developing Countries Sustainable Development Capacity and South South Cooperation for - china	01	දින 17	-	-	ඇ.ඩො 375	විදේශීය	
Seminar on Free Trade Zone (Port) Construction For Sri Lanka	01	දින 17	-	-	ඇ.ඩො 375	විදේශීය	
0917 - 0930 Seminar on Governance Capability for China-"Belt and Road" Countries From **17** to **30** September **2024**, in China	01	දින 17	රක්ෂණය 6,938.58	උණුසුම් ඇදුම් දීමනාව රු.30,012.60	ඇ.ඩො 375	විදේශීය	
0918-1001 Seminar on Cross border E-commerce Poverty Alleviation and Sustainable Development Capacity Building of Youth of Developing Countries	01	දින 17	-	-	ඇ.ඩො 375	විදේශීය	
Seminar on Application and Management of PPP Mode for Sri Lanka From **11** to **24** October **2024**, in China	01	දින 17	රක්ෂණය 6,787.56	-	ඇ.ඩො 375	විදේශීය	නිලධාරීන්ගේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර මට්ටමේ දැනුම හා පළපුරුද්ද ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත.
Seminar on Application and Management of PPP Mode for Sri Lanka From **11** to **24** October **2024**, in China	01	දින 17	-	-	ඇ.ඩො. 375	විදේශීය	
Seminar on Application and Management of PPP Mode for Sri Lanka From **11** to **24** October **2024**, in China	01	දින 17	රක්ෂණය 6,787.56	-	ඇ.ඩො. 375	විදේශීය	

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය			වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
Application and Management of PPP Mode for Sri Lanka From **11** to **24** October **2024**, in China and Public Debt Management Capacity Building Program Offered by Neighboring Countries Economic Development Agency (NEDA) Thailand	01	දින 06	-	-	ඇ.ඩො. 150	විදේශීය	නිලධාරීන්ගේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි ජාත්‍යන්තර මට්ටමේ දැනුම හා පළපුරුද්ද ලබා ගැනීමට අවස්ථාව සලසා ඇත
1012-1021 Seminar for Members of Global Development Promotion Center Network	01	දින 14	රක්ෂණය රු.5,263.89	ඇණුසුම් ඇදුම් දීමනාව රු.29,518.74	ඇ.ඩො. 300	විදේශීය	
Programme on invitation to the Belt and Road Initiative talent development programme senior seminar **2024** from **01** to **07** December in China	01	දින 10	රක්ෂණය රු.3,700.00	-	ඇ.ඩො. 175	විදේශීය	

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් නොවේ.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත් (ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල)	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**	අනුකූල වේ		
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		